ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025.12.16

ආර්.එස්. රංජිත් ආනන්ද
අංක 520/ඒ, පැතුම් නිවස,
පන්සල පාර, කීරික්කුලම,
ගල්කුලම.

**පැමිණිලිකාර පාර්ශවය**

දුම්රිය සාමාන්‍යාධිකාරි,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 355, ඕල්කට් මාවත,
කොළඹ 10.

**වගඋත්තරකාර පාර්ශවය**

**පැමිණිලි අංකය - HRC/KND/171/23/A**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම.**

පැමිණිලිකාර පාර්ශවය විසින් 2023.03.23 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල මගින් කියා සිටින්නේ, තමන් දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිටි බවත්, 2019.07.07 දින වයස අවු.60 සම්පූර්ණ වීම මත විශ්‍රාම ගන්වා ඇති බවත් ය. එසේම, තමා විශ්‍රාම ගැනීමට පෙර අංක වි.2583/05/2016(නා) සහ 2017.05.24 දිනැති චෝදනා පත්‍රය යටතේ තමාට එරෙහිව 2019.07.05 වන දින සිට 2019.10.25 වන දින දක්වා විනය පරීක්ෂණයක් පවත්වා ඊට අදාළව 2021.02.12 වන දින විනය නියෝගයක් ලබා දී ඇති බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. එකී නියෝගය අනුව තමා හට දඬුවම් තුනක් පනවා ඇති බවත්, ඉන් එකක් වනුයේ කටුගස්තොට දුම්රිය රක්ෂිතයට අයත් ඉඩම් කොටසක තම පුත්‍රයා විසින් ඉදිකර ඇති නිවස කඩා ඉවත් කර දුම්රිය නිවස නැවත දෙපාර්තමේන්තුව වෙත භාර දෙන තෙක් තමාගේ විශ්‍රාම වැටුප අවුරා තැබීම බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:12 වගන්තිය අනුව තමා විශ්‍රාම ගැන්වීමට කටයුතු කළ ද ඉහත කී නියෝගය හේතුවෙන් මේ වන තෙක් තම විශ්‍රාම වැටුප ලබාදීමට කටයුතු කර නොමැති බවත් පැමිණිලිකරු විසින් දක්වා ඇත.

එසේවුවද තම පුතා විසින් ඉදිකර ඇති නිවස සහිත ඉඩම් කොටස දුම්රිය දෙපාර්තමේන්තුව මගින් බදු ගිවිසුමක් මත 2022.01.01 දින සිට 2026.12.31 දින දක්වා තම පුත්‍රයාට ලබාදී ඇති බව ද, එය තම පුත්‍රයා හා දෙපාර්තමේන්තුව අතර කටයුත්තක් වන බව ද, එම කාර්යය සඳහා තමාගේ කිසිදු

සම්බන්ධයක් නොමැති බව ද පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. කෙසේවෙතත් විශ්‍රාම ගොස් වසර 6කට වැඩි කාලයක් ගතවී ඇති නමුත්, මේ දක්වාම තමාගේ විශ්‍රාම වැටුප සකස් නොකිරීම නිසා තමා මානසික මෙන්ම ආර්ථික පීඩනයන්ට පත්ව ඇති බැවින් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා තම විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා කටයුතු කර දෙන ලෙස පැමිණිලිකරු කොමිෂන් සභාව වෙතින් ඉල්ලා ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

වගඋත්තරකාර ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අංක.සලේ/ මාහිකොස/09/2023 සහ 2023.06.26 දිනැති වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් සඳහන් කරන්නේ,

01. පැමිණිලිකාර රංජිත් ආනන්ද මහතා විසින් මෙම දෙපාර්තමේන්තුවේ පොයින්ට්ස්මන්වරයෙකු ලෙස කටුගස්තොට දුම්රිය ස්ථානයට අනුයුක්තව සේවය කරමින් සිටියදි දුම්රිය රක්ෂිතයට අයත් ඉඩම් කොටසක් 2004 වසරේ පමණ සිට අනවසරයෙන් අත්පත් කරගැනීමට ඔහුගේ පුතාට ආධාර අනුබල දීමෙන් හා පුතා විසින් අනවසරයෙන් අත්පත් කරගත් රක්ෂිතයේ 2004 වසරේ පමණ සිට අනවසර ඉදිකිරීමක් සිදුකිරීම මත තමාගේ අංක වි.2583/05/2016 හා 2017.05.24 දිනැතිව රජයේ දේපල අයථා පරිහරණයට පත්කිරීම හේතුවෙන් ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ පළමු උපලේඛණය යටතේ චෝදනා පත්‍රය මගින් අංක I සිට V දක්වා වූ චෝදනා 05ක් ගොනු කර ඇති බවත්,

02. 2017.06.05 දිනැතිව එම චෝදනා පත්‍රය සම්බන්ධයෙන් පැමිණිලිකාර ආනන්ද මහතා කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, එහි චෝදනා පිළිගත නොහැකි බවත්, විධිමත් විනය පරීක්ෂණයක් ඉල්ලා සිටින බවත් ය. ඒ අනුව තමාගේ අංක වි.2583/05/2016(නා.) හා 2017.09.13 දිනැතිව විනය පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කරන ලද බවත්, මෙම විනය පරීක්ෂණය සිදුවන අතරතුර 2019.07.07 දින වයස අවු.60 සම්පූර්ණ වීම මත පැමිණිලිකරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:12 අනුව විශ්‍රාම ගැන්වීමට කටයුතු කර ඇති බවත්, මෙම විනය පරීක්ෂණයේදි චෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවන්ට වැරදිකරු බව නිගමනය කරමින් තමාහට වි.2583/05/2016(නා.) හා 2021.02.12 දිනැතිව දඬුවම් පමුණුවා ඇති බවත්,

03. එහෙත් දඬුවම් නියෝගය පරිදි පැමිණිලිකරු පදිංචි කටුගස්තොට ඒ 01 දරණ යුගල දුම්රිය නිවස මේ දක්වා භාරදී නොමැති බැවින් විශ්‍රාම වැටුප් ගෙවීමේ කටයුතු සිදුකිරීමේ හැකියාවක් නොමැති බවත්, කෙසේ වෙතත් මෙම දඬුවම් නියෝගයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැමිණිලිකරු විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත්, ඊට අදාළව උප දෙපාර්තමේන්තු ප්‍රධානි වන නියෝජ්‍ය අධිකාරී (ගමනාගමන) වෙතින් එහි එක් එක් ඡේදය

යටතේ නිරීක්ෂණ හා නිර්දේශ ලබාදෙන ලෙස දන්වා ඇති බවත්, එය තමා වෙත ලැබීමෙන් අනතුරුව මේ සඳහා සුදුසු නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂම වෙත යොමු කිරීමට කටයුතු කරන බවත්, මේ දක්වා අනවසර ඉදිකිරීම ඉවත් කර දුම්රිය නිවාසය නැවත දෙපාර්තමේන්තුව වෙත භාරදී නොමැති වීම හේතුවෙන් විශ්‍රාම වැටුප් සකස් කිරීමේ හැකියාවක් නොමැති බවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙන නියෝග අනුව ඉදිරි පියවර ගන්නා බවත් ය.

<u>නිරීක්ෂණ</u>

පැමිණිලිකරු 1983.05.03 වන දින ආදේශක සේවක පදනම මත ශ්‍රී ලංකා දුම්රිය සේවයට බැඳී සේවා අංක 6022 යටතේ පොයින්ට්ස්මන්වරයෙකු ලෙස වසර 33ක සේවා කාලයකින් පසු 2019.07.07 දින විශ්‍රාම ගන්වා ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු කටුගස්තොට ඒ-01 දරණ යුගල දුම්රිය නිවාසයේ පදිංචිව සිට ඇති බවත්, දුම්රිය රක්ෂිතයට අයත් ඉඩම් කොටසක් 2004 වර්ෂයේ සිට අනවසරයෙන් අත්පත්කර ගැනීමට ඔහුගේ පුතාට ආධාර අනුබලදීමෙන් හා පුතා විසින් අනවසරයෙන් අත්පත් කරගත් රක්ෂිතයේ 2004 වසරේ සිට අනවසර ඉදිකිරීමක් සිදුකිරීම මත 2017.05.24 දිනැතිව රජයේ දේපල අයථා පරිහරණයට පත්කිරීම යන චෝදනාව නගමින් පැමිණිලිකරුට එරෙහිව චෝදනා පත්‍ර ගොනුකර ඇති බවත් පෙනී යයි.

පැමිණිලිකරු හට වගඋත්තරකාර පාර්ශවය විසින් අංක වි.2583/05/2016(නා.) සහ 2021.02.12 දිනැති ලිපිය යොමු කරමින්, පැමිණිලිකරුට එරෙහිව අංක වි.2583/05/2016(නා.) සහ 2017.05.24 දිනැති චෝදනා පත්‍රය ප්‍රකාරව පවත්වන ලද විනය පරීක්ෂණයේ දී එකී චෝදනා පත්‍රයේ සඳහන් එක් චෝදනාවකට පමණක් පැමිණිලිකරු නිවැරදිකරු වී ඇති බවත්, අනෙක් චෝදනා හතර සඳහා වැරදිකරු වී ඇති බවත් සඳහන් කර ඇත. ඒ අනුව පැමිණිලිකරු කටුගස්තොට දුම්රිය රක්ෂිතයට අයත් ඉඩම් කොටසක් 2004 වසර පමණ සිට අනවසරයෙන් අත්පත් කරගැනීමට පැමිණිලිකරුගේ පුතාට ආධාර අනුබල දීම, එලෙස අත්පත් කරගත් දුම්රිය රක්ෂිතයේ 2004 වසර පමණ සිට අනවසර ඉදිකිරීමක් සිදු කිරීමට පුතාට අනුබල දීම, ඒ ආකාරයෙන් කටයුතු කිරීමෙන් සෙසු කාර්ය මණ්ඩලයට නරක ආදර්ශයක් ලබා දීම සහ එවැනි ආකාරයට කටයුතු කිරීමෙන් දෙපාර්තමේන්තුවේ විනය පරිහානියට පත් කිරීම යන චෝදනා හතර සඳහා පැමිණිලිකරු වරදකරු වන බවට වගඋත්තරකාර පාර්ශවය විසින් තීරණය කර ඇති බව නිරීක්ෂණය වේ.

විධිමත් විනය පරීක්ෂණයෙන් එක් චෝදනාවකට පමණක් පැමිණිලිකරු නිවැරදිකරු වී ඇති අතර අනෙක් චෝදනා හතර සඳහා වැරදිකරු වීම හේතුවෙන් පහත පරිදි දඬුවම් 3ක් පමුණුවා ඇත.

I. අනවසර ඉදිකිරීම ඉවත්කර දුම්රිය නිවස දෙපාර්තමේන්තුවට නැවත භාරදෙන තෙක් විශ්‍රාම වැටුප් අවුරා තැබීම,

II. දුම්රිය නිවාසය නැවත දෙපාර්තමේන්තුවට භාරදෙන දිනය දක්වා කාලයට දණ්ඩනීය කුලිය අය කිරීම,

III. රු.10,000.00ක දඩයක් විශ්‍රාම පාරිතෝෂිකයෙන් අය කර (විශ්‍රාම පාරිතෝෂිකය ලබා නොගන්නේ නම් ඉහත සඳහන් දඬුවම් වලට අදාළ මුදල මාසික විශ්‍රාම වැටුපෙන් අය කිරීම)

පැමිණිලිකරුට එරෙහිව විනය පරීක්ෂණය පවතින අතරතුර පැමිණිලිකරු වයස අවු: 60 සම්පූර්ණ වීම මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2.12 වගන්තිය අනුව 2019.07.07 දින සිට විශ්‍රාම ගන්වා ඇති අතර, පැමිණිලිකරුට එරෙහිව විනය නියෝග 2021.02.12 දිනැතිව නිකුත් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ පුත්‍රයා විසින් අදාළ අනවසර ඉදිකිරීම 2004 වර්ෂයේ සිට සිදුකර එහි පදිංචිව සිට ඇති බවත්, 2008 වර්ෂයේ සිට ඒ සඳහා පරිහරණ ගාස්තු ද දුම්රිය දෙපාර්තමේන්තුව මගින් අයකරගෙන ඇති බවත්, අංක LC/2022/007 සහ 2022.10.19 දැනැති බදු ගිවිසුම ප්‍රකාරව 2022 වර්ෂයේ ජනවාරි 01 වන දින සිට 2026 දෙසැම්බර් 31 දක්වා පැමිණිලිකරුගේ පුත්‍රයාට අදාළ අනවසර ඉදිකිරීම සහිත ඉඩම් කොටස බදු පදනම මත ලබා දීමට වගඋත්තරකාර පාර්ශවය විසින් ක්‍රියා කර ඇති බවත් ඉදිරිපත්ව ඇති ලේඛන අනුව අනාවරණය වේ. ඒ අනුව පැමිණිලිකරුට එරෙහිව 2021.02.12 දිනැතිව විනය නියෝගය නිකුත් කර තිබියදී 2022.01.01 දින සිට එකී විනය නියෝගය ප්‍රකාරව අනවසර ඉදිකිරීම ඉවත්කර දුම්රිය නිවස දෙපාර්තමේන්තුවට නැවත භාරදිය යුතු ඉඩම් කොටසට අදාළව පැමිණිලිකරුගේ පුත්‍රයා සමඟ වගඋත්තරකාර පාර්ශවය විසින් බදු ගිවිසුමකට එළඹ ඇති බවත්, එකී ගිවිසුම ප්‍රකාරව අදාළ ඉඩම් කොටස භුක්ති විඳීම සඳහා පැමිණිලිකරුගේ පුත්‍රයා හට මේ වන විට නීත්‍යානුකූල හිමිකමක් ලැබී ඇති බවත් නිරීක්ෂණය වේ.

ඒ අනුව ඉහත කී බදු ගිවිසුම බලාත්මකව පැවතීම හේතුවෙන්, පැමිණිලිකරුට එරෙහිව 2021.02.12 දිනැතිව ලබා දී විනය නියෝගයෙහි පළමුවන දඬුවම මගින් අපේක්ෂිත අනවසර ඉදිකිරීම ඉවත්කර දුම්රිය නිවස දෙපාර්තමේන්තුවට නැවත භාරදීම යන්න ඉටු කිරීමට පැමිණිලිකරුට හැකියාවක් නොමැති බව පෙනී යයි. කෙසේවෙතත් පැමිණිලිකරු තමා විසින් පරිහරණය කළ කටුගස්තොට අංක ඒ-01 දරණ දුම්රිය යුගල නිවාසය 2023.11.17 දින පදිංචිය හිස්කර දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇති බව මහනුවර අධීක්ෂණ කළමණාකරු (ගොඩනැගිලි) විසින් ප්‍රවාහන අධිකාරී, නාවලපිටිය වෙත යොමු කර ඇති අංක අධි.කළ.(ගො)ඩබ.15/11/2023 සහ 2023.11.18 දිනැති ලිපිය ප්‍රකාරව තහවුරු වේ.

<u>නිගමනය</u>

පැමිණිලිකරු තම පුතා හට කටුගස්තොට දුම්රිය රක්ෂිතයට අයත් ඉඩම් කොටසක් 2004 වසර පමණ සිට අනවසරයෙන් අත්පත් කරගැනීමටත්, එහි අනවසර ඉදිකිරීමක් සිදු කිරීමටත් ආධාර අනුබල දීම හේතුවෙන් වැරදිකරුවෙකු වන බවට තීරණය කර, එකී අනවසර ඉදිකිරීම ඉවත්කර දුම්රිය නිවස දෙපාර්තමේන්තුවට නැවත භාරදෙන තෙක් විශ්‍රාම වැටුප් අවුරා තබන බවට 2021.02.12 වන දිනැති

ලිපිය මගින් වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු හට දඬුවමක් පනවා ඇත. එහෙත් 2008 වර්ෂයේ සිට එකී අනවසර ඉදිකිරීමට අදාළව පැමිණිලිකරුගේ පුතාගෙන් පරිහරණ ගාස්තු අය කරගැනීමට දුම්රිය දෙපාර්තමේන්තුව කටයුතු කිරීම මගින් අදාළ අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරුගේ පුතා සමඟ සෘජුව කටයුතු කර ඇති බවත්, ඒ සඳහා පැමිණිලිකරු සම්බන්ධ වී නොමැති බවත් නිරීක්ෂණය වේ. එවැනි පසුබිමක් තුළ පැමිණිලිකරු විසින් ඔහුගේ පුතා හට කටුගස්තොට දුම්රිය රක්ෂිතයට අයත් ඉඩම් කොටසක් 2004 වසර පමණ සිට අනවසරයෙන් අත්පත් කරගැනීමටත්, එහි අනවසර ඉදිකිරීමක් සිදු කිරීමටත් ආධාර අනුබල දුන් බවට චෝදනා නැගීමත්, එකී චෝදනාව සඳහා වරදකරු බව තීරණය කර පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුප අහිමි කිරීමත් යුක්ති සහගත නොවන බව කොමිෂන් සභාව වෙත පෙනී යයි. එසේම, අදාළ ප්‍රශ්නගත ඉඩම් කොටස රජය සතු ඉඩමක් වන බැවින් එහි සන්තකය නැවත පවරා ගැනීම සඳහා වගඋත්තරකාර පාර්ශවය විසින් කටයුතු කළ යුතු වන්නේ 1979 අංක 7 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ විධිවිධාන ප්‍රකාරව ය.

එසේම, 2021.02.12 වන දින එකී ඉවත් කරන ලෙසට දැනුම් දුන් අනවසර ඉදිකිරීම, 2022.10.19 වන දින පැමිණිලිකරුගේ පුතා වෙත බදු ගිවිසුමක් මගින් බදු දීමට වගඋත්තරකාර පාර්ශවය විසින්ම කටයුතු කර ඇත. 2021.02.12 වන දිනැතිව ඉවත් කරන ලෙසට දැනුම් දුන් අනවසර ගොඩනැගිල්ලක් නැවත 2022.10.19 වන දින බදු දීමට කටයුතු කිරීම හේතුවෙන් වගඋත්තරකාර පාර්ශවය නිසි වගකීමකින් තොරව කටයුතු කර ඇති බව තහවුරු වේ. ඒ හේතුවෙන් පැමිණිලිකරු 2019.07.07 වන දින විශ්‍රාම ලැබුව ද මේ වන තෙක් වසර හයකට අධික කාලයක් පැමිණිලිකරු හට සිය විශ්‍රාම වැටුප අහිමි වී ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ පුතා විසින් 2025.10.27 වන දින අදාළ ප්‍රශ්නගත දේපළ ශ්‍රී ලංකා දුම්රිය ආරක්ෂක සේවය, මහනුවර වෙත භාර දී ඇති බවට එහි කාර්යභාර නිලධාරී විසින් සටහන් යොදා ඇති බව ද නිරීක්ෂණය වේ. ඒ අනුව 2021.02.12 වන දිනැති විනය නියෝගය ප්‍රකාරව අනවසර ඉදිකිරීම ඉවත්කර දුම්රිය නිවස දුම්රිය දෙපාර්තමේන්තුවට නැවත භාර දී ඇති බැවින් එතෙක් අවුරා තබන ලද විශ්‍රාම වැටුප පැමිණිලිකරු වෙත ලබාදීමට වගඋත්තරකාර පාර්ශවය වෙත මේ වන විට කිසිදු බාධාවක් නොමැති බව ද නිරීක්ෂණය වේ.

කෙසේවෙතත් ඉහතින් සඳහන් කර ඇති පරිදි පැමිණිලිකරුගේ පුතා විසින් කටුගස්තොට දුම්රිය රක්ෂිතයට අයත් ඉඩම් කොටසක් 2004 වසර පමණ සිට අනවසරයෙන් අත්පත් කරගැනීමටත්, එහි අනවසර ඉදිකිරීමක් සිදු කිරීමටත් කටයුතු කර ඇති බව අනාවරණය කරගත් අවස්ථාවේ දී, එකී ඉඩම් කොටස රජය සතු ඉඩමක් වන බැවින් වගඋත්තරකාර පාර්ශවය විසින් එහි සන්තකය නැවත පවරා ගැනීම සඳහා 1979 අංක 7 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු සිදු කර එය ලබා ගැනීමේ නීතිමය හිමිකම පැවතිනි. එසේ තිබියදී එකී නීතිමය පරිපාටිය අනුගමනය නොකොට අදාළ ඉඩම අත්පත් කරගැනීමට ආධාර අනුබල දුන් බවට

පැමිණිලිකරු හට චෝදනා ගොනු කර පරීක්ෂණයක් පවත්වා පැමිණිලිකරු වැරදිකරු බවට තීරණය කර ඔහුගේ විශ්‍රාම වැටුප අවුරා තැබීම මගින් වගඋත්තරකාර පාර්ශවය විසින් පවත්නා නීති ප්‍රතිපාදනයන්ට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්ව ඇති බව තහවුරු වේ. ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතුය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය ඉදිරිපත් කර සිටී.**

පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුප 2026. 01 . 29 වන දින හෝ එදිනට පෙර ගෙවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට වගඋත්තරකාර පාර්ශවය විසින් කටයුතු කළ යුතු ය.

(2026) 2025. 01. 28 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- අමාත්‍යතුමා,
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන
අමාත්‍යාංශය
7 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල
- කරුණු දැනගැනීම සඳහා